# රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
## பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
## Ministry of Public Administration, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව    சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.   Independence Square, Colombo 07, Sri Lanka

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2696211-13<br>011-2166000 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2695279 | ඊ-මේල්<br>மின்னஞ்சல்<br>E-mail | info@pubad.gov.lk | වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>Telephone | www.pubad.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | CS/SLAS/Vacancies- Reply (Vol. I) | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2025.02.24 |

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන නිවේදනයයි.

**<u>නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය</u>**

**<u>සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය සඳහා ද්විතීයන පදනම මත නිලධාරීන් ලබා ගැනීම</u>**

නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය යටතේ වන සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ පුප්පාඩුව පවතින සහකාර සාමාන්‍යාධිකාරි (මානව සම්පත්/පරිපාලන) හා සහකාර සාමාන්‍යාධිකාරි (නීති) තනතුරු සඳහා ද්විතීයන පදනම මත ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සුදුසු නිලධාරියෙකු අනුයුක්ත කර දෙන ලෙස, එම අමාත්‍යාංශ ලේකම්ගේ අංක: MUDH/UDEP/U 01/07/05/01/I හා 2024.12.05 දිනැති ලිපිය මගින් දන්වා ඇත.

02. ඒ අනුව, ඇමුණුම I හි සඳහන් සුදුසුකම් සපුරා ඇති, සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ පුප්පාඩුව පවතින සහකාර සාමාන්‍යාධිකාරි (මානව සම්පත්/පරිපාලන) හා සහකාර සාමාන්‍යාධිකාරි (නීති) තනතුරු සඳහා ද්විතීයන පදනම මත අනුයුක්ත වීමට මනාපය පළ කරනු ලබන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් වේ නම්, 2025.03.10 දින හෝ ඊට පෙර ඒ සම්බන්ධයෙන් වන ලිඛිත ඉල්ලීමක්, ජීව දත්ත සටහනක් සමඟ ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව, සභාපති සභාධිපත්‍ය කළමණානාකරණ අධිකාරිය, 1 වන මහල, ජාතික නිවාස දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල, සර් චිත්තම්පලම් ඒ ගාර්ඩිනාර් මාවත, කොළඹ 02 යන ලිපිනයට ලියාපදිංචි තැපෑල ඔස්සේ යොමු කළ යුතු අතර කවරයේ ඉහළ වම්පස කෙළවරේ තනතුර පැහැදිළිව සඳහන් කරන ලෙස කාරුණිකව දන්වමි.

03. තව ද, අයදුම්පත් යොමු කිරීමේදී, අයදුම්කරුවන් මෙම තනතුර සඳහා සුදුසුකම් ලදහොත් දැනට සේවයේ නියුතු සේවා ස්ථානයෙන් අනුප්‍රාප්තිකයෙකු සහිතව /රහිතව/ පසුව ලබා දීමේ පදනම මත මුදා හැරිය හැකි බවට ස්වකීය අමාත්‍යාංශ ලේකම් හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා සහතික කර අයදුම්පත ඉදිරිපත් කළ යුතුය.

04. එම තනතුරට අදාළ වන කාර්යභාරය සහ වැඩිමනත් තොරතුරු අවශ්‍ය වේ නම්, “සභාධිපත්‍ය කළමනාරණ අධිකාරියේ සභාපති - 0112-334151හෝ 0112-444575” වෙතින් විමසන ලෙස ද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

සජීවනී අතපත්තු
අධ්‍යක්ෂ (ශ්‍රී ලං.ප.සේ)
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන
අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට
දුරකථන : 0112-698605 / ෆැක්ස් : 0112 – 683651
විද්‍යුත් ලිපිනය: pubad.dslas@gmail.com

**2. සහකාර සාමාන්‍යාධිකාරී (මානව සම්පත්/පරිපාලන) M.M. 1-1 "කළමනාකාර" තනතුරු 01 කි.**

**තනතුරට අදාළ සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/ කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය/ රාජ්‍ය කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් එම ක්ෂේත්‍රයේ වසර එක (01) ක පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

හෝ

2. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ කණිෂ්ඨ කළමනාකාර සේවා ශ්‍රේණියේ (JM) අදාළ ක්ෂේත්‍රයේ තනතුරක වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස**

වයස අවු. 22 ට නොඅඩු අවු. 45 ට නොවැඩි අය විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

වැටුප – MM 1-1 – රු. 53,175 – 10 x 1,375 – 15 x 1,910 = 95,575

- රජය විසින් අනුමත සියලුම දීමනා සහ ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.
- දුරකථන බිල්පත් සීමාවකට යටත්ව ප්‍රතිපූරණය කරනු ලැබේ.

# සහකාර සාමාන්‍යාධිකාරී (නීති)
# MM 1-1 "කළමනාකාර" සේවා ශ්‍රේණිය - තනතුරු 01 කි

## සුදුසුකම්

### බාහිර අයදුම්කරුවන්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිවේදී උපාධියක් ලබා තිබීම සමග ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසුව වසර තුනකට (03) නොඅඩු සක්‍රිය වෘත්තීය පළපුරුද්ද.

### අභ්‍යන්තර අයදුම්කරුවන්

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

**වැටුප:** MM 1-1 - රු.53,175 - 10x1,375 - 15x1,910 = 95,575

- රජය විසින් අනුමත සියලුම දීමනා සහ ජීවන වියදම් දීමනාව ගෙවනු ලැබේ.
- දුරකථන බිල්පත් සීමාවකට යටත්ව ප්‍රතිපූර්ණ කරනු ලැබේ.

**වයස :** අවුරුදු 33ට නො අඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපායි.

### සෑම අයදුම්කරුවෙකුම,

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

### තනතුරට අදාළ පොදු කොන්දේසි

- මෙම තනතුර ස්ථිර වන අතර, විශ්‍රාම වැටුප් රහිතය. සේවක අර්ථසාධක අරමුදලට සේවකයාගෙන් 10% ක් සහ සේව්‍යාගෙන් 15% ක්ද, සේවක භාරකාර අරමුදලට සේව්‍යාගෙන් 3% ක්ද දායකත්වය දරනු ලබයි.
- රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් මගින් අයදුම්පත් ඉදිරිපත් කළයුතු වේ.
- අයදුම්කරු පිළිබඳ වාර්තා ලබාගත හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් අයදුම්පත සමග ඉදිරිපත් කළයුතුය.
- අධ්‍යාපන, වෙනත් සහතික හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් අයදුම්පතට අමුණා එවිය යුතුවේ.
- අයදුම්කරුවන් විසින් ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට සියලුම සුදුසුකම් සපුරා තිබිය යුතු වේ.